# ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

## වැවල - හොරණ

DEAN FACULTY OF MEDICINE
20 MAY 2015
P-3082
UNIVERSITY OF PERADENIYA

NB E-NB

### අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු

මෙම මණ්ඩපයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලබා ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල ස්ථිර සේවයේ නියුතු සේවකයින්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ එවා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කර ගත් අයදුම්පත් තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරී/ අධ්‍යක්ෂ/ මණ්ඩපාධිපති මගින් 2015-05-29 දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලේඛනගත තැපෑලෙන් ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී** වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ. එසේ කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කළ විට කුමන හෝ හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

1996-10-18 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව ලිඛිත හෝ ප්‍රායෝගික යෝග්‍යතා පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම් කරගෙන සුදුස්සන් බඳවා ගනු ලැබේ.

| 01. කාර්මික නිලධාරී II ශ්‍රේණිය (ආ) කණ්ඩය තනතුර |
|---|

සුදුසුකම් :

1. (අ) අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සමාර්ථ පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම. සම්මාන සාමාර්ථ ලබා ගත් විෂයයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයයන් හයක් (06) සමත්ව තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ඇ) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සේවකයෙකු ලෙස වසර පහළොවක (15) සතුටුදායක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.

**විශේෂ සටහන :** ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ පරිහරණය, වාර්තාමය වැඩ සටහන්, කෙටි චිත්‍රපට නිෂ්පාදනය සහ සංස්කරණ කටයුතු, වේදිකා ආලෝකකරණය සහ ශබ්ද පරිපාලනය, වේදිකා සැකසීම, සංගීත හා නර්තන භාණ්ඩ පරිහරණය හා විශේෂයෙන් ජනමාධ්‍ය සහ ප්‍රසංගකලා විෂයානුබද්ධ කාර්මික ශිල්පී ඥානය, සේවා පළපුරුද්ද ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය** : U – MT1 (III A)

රු: 16,535 – 7x155; 10x185 - 19,470/- (මාසික)

**බඳවා ගැනීමේ ක්‍රමය** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 02. ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය

සුදුසුකම් :

1. (අ) සම්මාන සාමාර්ථයන් පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම. සම්මාන ලත් විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුලත් විය යුතුය.

හෝ

(ආ) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් (06) කින් සමත් වී ඇති විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක ස්ථිර සේවයක් තිබෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සේවකයෙකු වීම.එසේ සමත් වූ විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුලත් විය යුතුය.

සහ

2. පොලිස් සේවයේ හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආරක්ෂක සේවයේ හෝ වෙනත් පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක වසර පහකට (05) නොඅඩු සතුටුදායක සේවයක් තිබිය යුතුය.

3. ක්‍රීඩා කටයුතුවල ක්‍රියාශීලී සහභාගීත්වය තිබිය යුතුය.

4. උස : අඩි 05 අඟල් 04 කට නොඅඩු විය යුතුය.
පපුව : අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

වැටුප් පරිමාණය : රු: 16,070 – 17x155 - 18,705/- (මාසික)

{U-MN 1 (III A)}

බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 03. භාණ්ඩ භාරකරු හා අළුත්වැඩියා කරන්නා II ශ්‍රේණිය (ප්‍රසංග කලා අධ්‍යයනාංශය සඳහා)

සුදුසුකම් :

1. (අ) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත් විය යුතුය.

හෝ

(ආ) අට ශ්‍රේණිය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක අවුරුදු පහක් (05) ස්ථිර සේවා කාලයක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

2. උසස් අධ්‍යාපන ආයතනයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක අවුරුදු දෙකකට (02) නොඅඩු කාලයක් නර්තන හා සංගීත භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ පළපුරුද්දක් හා හැකියාවක් තිබිය යුතුය.

3. භාණ්ඩ නිකුත් කිරීමේ ලේඛන පවත්වා ගෙන යාමේ සහ නර්තන හා සංගීත භාණ්ඩ ගබඩා කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුය

**වැටුප් පරිමාණය** : රු: 16,070 – 17x155 - 18,705/- (මාසික)

{U-MN 1 (III A)}

**බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සටහන :** නර්ථන හා සංගීත භාණ්ඩ භාවිතා කිරීමේ හැකියාවක් හා දැනීමක් ඇති අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

## 04. පොම්ප ක්‍රියාකරු II ශ්‍රේණිය

සුදුසුකම් :

1. කියවීමේ හා ලිවීමේ හැකියාව

2. පහත සඳහන් කරුණු පිළිබඳව නිපුනත්වයක් ලබා තිබිය යුතුය.

   (අ) අඟලෙන් 1/32 දක්වා පරිමානක සුක්ෂම මානක කියවීම සහ භාගික මාන සටහන් කිරීම එන්ජින් සහ පොම්ප ක්‍රියාකරවීම ඒවායේ එදිනෙදා නඩත්තු කිරීම් සිරු මාරු කිරීම් තෙල් මාරු කිරීම් ෆිල්ටර් මාරු කිරීම් ආදිය

   (ආ) පීඩනමාන උෂ්ණත්ව මානක ආදිය කියවා තේරුම් ගැනිම ස්පර්ශක ආමන භාවිතය

   (ඇ) එන්ජින් සහ පොම්පවල සුළු අළුත්වැඩියාවන් කිරීම අවශ්‍ය අමතර කොටස් යොදා නැවත සවිකිරීම ආදිය

3. රජයේ දෙපාර්තුමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක පයිප්පකරුවෙකු වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : U – PL 2 (III)

රු: 14,670 – 16XI40 - 16,910/- (මාසික)

**බඳවා ගැනීමේ ක්‍රමය** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

එල්.පී. ගුණවර්ධන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ශ්‍රීපාලි මණ්ඩපය,
වැවල,හොරණ
05.05.2015

DEAN FACULTY OF MEDICINE
20 MAY 2015
UNIVERSITY OF PERADENIYA

# THE OPEN UNIVERSITY OF SRI LANKA

## POST OF CHIEF SECURITY OFFICER GRADE II

Applications are invited from suitably qualified persons for the above Post. The persons appointed will be expected to make a significant contribution to the management of the Open University.

**QUALIFICATIONS** :

(1 An Officer not below the rank of Assistant Superintendent of Police, Captain of the Army or an Officer of equivalent rank in the other Armed Services ;

**OR**

(2) person who possesses a degree from a recognized University/HEI with not less than five (05) years of experience in security work ;

**OR**

(b) A holder of the post of Security Inspector, Grade I or above in the University Security Service and confirmed in the present post with not less than eight (08) years of satisfactory service in those grades.

**SALARY SCALE** : **U-EX 1(II)**
**Rs. 26,020-3x585-27,775(EB) 28,420 ; 12x645 – 36,160 p.m.**

**METHOD OF RECRUITMENT :** Structured Interview

**HOW TO APPLY** :

Applications for the above post should be made in the prescribed form sent herewith and returned to the Senior Assistant Registrar/Establishments, The Open University of Sri Lanka, Nawala, Nugegoda under registered cover along with copies of relevant certificates to reach on or before 25th May, 2015 indicating the post for which the application is made on the top left hand corner of the envelope. Candidates should channel their applications through the Head of their respective Institution and incomplete & late applications will be rejected.

**Registrar**

DEAN FACULTY OF MEDICINE
20 MAY 2015
UNIVERSITY OF PERADENIYA

# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

## මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරය සඳහා

## අයදුම්පත්‍ර/නාම යෝජනා කැඳවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2012 අංක 15 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යාය ධුරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේලාගෙන් අයදුම්පත්/ නාම යෝජනා කැඳවනු ලැබේ.

02 (1) අවුරුදු දෙකකට නොඅඩු කාලයක් තුළ කරන ලද පර්යේෂණ මත පිළිගත් විශ්වවිද්‍යාලයකින් බෞද්ධ අධ්‍යයනයට හෝ එයට සම්බන්ධ වෙනත් යම් විෂයයක් පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(2) අධ්‍යයන ක්ෂේත්‍රයේ වසර දහයක පළපුරුද්දක් ලබා තිබීම.

(3) ප්‍රාචීන භාෂා පිළිබඳ හසල දැනුමක් ලබා තිබීම.

(4) උපසම්පදාව ලැබීමෙන් පසු වසර 20 ක් සම්පූර්ණ කර ඇති විනයධර භික්ෂූන් වහන්සේ නමක් වීම.

03 මහෝපාධ්‍යායයන් වහන්සේ වර්ෂ 03 ක කාලයකට පත් කරනු ලබන අතර, උන්වහන්සේ විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියෙකු ද, ප්‍රධාන විධායක, ප්‍රධාන ශාස්ත්‍රීය හා විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිලධාරියා ද වන්නේය. උන්වහන්සේ නිලබලයෙන් උත්තරීතර සභාවේ සාමාජිකයෙක් වන අතර විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් ද සභාපති ද වන්නේ ය. විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේ වගකිව යුතුය. විශ්වවිද්‍යාලයේ පාලක සභාව හා සනාතන සභාව විසින් ගනු ලබන තීරණ ද, ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම උන්වහන්සේගේ වගකීම වන්නේ ය. මහෝපාධ්‍යායයන් වහන්සේට වර්ෂ 3 ක කාල සීමාවකට හෝ හැටපස් (65) වන විය සම්පූර්ණ කිරීම හෝ යන දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දැරිය හැකිය.

04 මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. මහෝපාධ්‍යායයන් වහන්සේ සඳහා නිල වාහනයක්, ඉන්ධන දීමනාවක් සහ විශ්වවිද්‍යාලය තුළ නිල නේවාසික පහසුකම් සපයනු ලැබේ.

05 අයදුම්කාර භික්ෂූන් වහන්සේ විශ්වවිද්‍යාල පද්ධතියේ රාජ්‍ය සේවයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු හිමි නමක වන්නේ නම්, සිය ආයතන ප්‍රධානියා මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළයුතු අතර, මෙම ධුරයට තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකි බව අයදුම්පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම වගන්තිය ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ භික්ෂූන් වහන්සේලාට අදාළ නොවේ.

06 තමන් විසින් සකස්කර ගත් අයදුම්පත්‍රය/නාම යෝජනා පත්‍රය සමග ඉහත 02 ඡේදයේ (1),(2),(3) සහ (4) සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛනවල පිටපත් හා පහත සඳහන් ලියකියවිලි අයදුම්පත්‍රය/නාමයෝජනා පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ. (ලිපි ලේඛන වල මුල් පිටපත් ඉල්ලා සිටින විට ඉදිරිපත් කළ යුතුය.)